# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2203/5 - 2020 නොවැම්බර් මස 23 වැනි සඳුදා - 2020.11.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1978 අංක 41 නාගරික සංවර්ධන අධිකාරි පනතේ ප්‍රතිපාදන අනුව පිළියෙල කරන ලද කොළඹ නගර සංවර්ධන සැලැස්ම 2008 (සංශෝධිත) ප්‍රතිසංශෝධනය අනුමත කිරීමේ දැන්වීම

නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මා 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 8ඊ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2008 කොළඹ නගර සංවර්ධන සැලැස්මේ යෝජිත සංශෝධන අනුමත කරන ලද බව වරින් වර සංශෝධිත 1978 අංක 41 8උ වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මහජනතාව වෙත මෙයින් දන්වමි.

1999 කොළඹ නගර සංවර්ධන සැලැස්ම සංශෝධනය කරමින් 2008 (සංශෝධිත) කොළඹ නගර සංවර්ධන සැලැස්මේ 4.5 සහ 5 වන වගන්තියට අදාළව පහත සංශෝධනයන් 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 8 ඌ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මා මෙයින් අනුමත කරමි.

කොළඹ නගර සංවර්ධන සැලැස්ම (සංශෝධිත) - 2008, 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

1. කොළඹ නගර සංවර්ධන සැලැස්මේ 5 වන වගන්තිය (මූලික කොළඹ නගර සංවර්ධන සැලැස්ම 1999 සහ 2008 වශයෙන් හඳුන්වනු ලබන) පහත සඳහන් විධිවිධාන ඇතුළත් කිරීම මගින් තව දුරටත් සංශෝධනය කෙරේ.

i. උතුරු දිශාවෙන් මල් පාර සහ වාළුකාරාම පාරද, නැගෙනහිර දිශාවෙන් කුමාරතුංග මුනිදාස මාවතෙහි සහ සර් අර්නස්ට් ද සිල්වා මාවතෙහි බස්නාහිර දිශාවේ පළමු බිම් කොටස් දක්වා වූ මායිම්ද, දකුණු දිශාවෙන් රීඩ් අවේනුව් හි බස්නාහිර දිශාවේ පළමු බිම් කොටස් දක්වා වූ මායිම් ද සහ රැජින පාරද, බස්නාහිර දිශාවෙන් ආර්. ඒ. ද මැල් මාවතෙහි නැගෙනහිර දිශාවේ පළමු බිම්කොටස් දක්වා වූ මායිම් ද සහ 27 වන සහ 37 වන පටුමග දිගේ මායිම් වන “විශේෂ ප්‍රාථමික නේවාසික කලාපය” මින්මතු “මිශ්‍ර සංවර්ධන කලාපයක්” වේ.

ii. උතුරු දිශාවෙන් ලෝරිස් පාරද, නැගෙනහිර දිශාවෙන් හැව්ලොක් පාරෙහි බස්නාහිර දිශාවේ පළමු බිම් කොටස් දක්වා වූ මායිම්ද, දකුණු දිශාවෙන් කිරුලපන ඇල මායිමද, බස්නාහිර දිශාවෙන් ආර්. ඒ. ද මැල් මාවතෙහි සහ ලෙයාර්ඩ්ස් පාරෙහි නැගෙනහිර දිශාවේ පළමු බිම්කොටස් දක්වා වූ ද මායිම් වන “විශේෂ ප්‍රාථමික නේවාසික කලාපය” මින්මතු “මිශ්‍ර සංවර්ධන කලාපයක්” වේ.

iii. උතුරු දිශාවෙන් ලෝරිස් පාර සහ බෞද්ධාලෝක මාවතද, නැගෙනහිර සහ බස්නාහිර දිශාවෙන් හැව්ලොක් පාරෙහි දෙපස පළමු බිම් කොටස් හි අවසාන මායිම් දක්වාද, දකුණු දිශාවෙන් කිරුලපන ඇල මායිම දක්වාද මායිම්වන “විශේෂ මිශ්‍ර නේවාසික කලාපය” මින්මතු “මිශ්‍ර සංවර්ධන කලාපයක්” වේ.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කොළඹ නගර සංවර්ධන සැලැස්ම (සංශෝධිත) - 2008, 4.5 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. කොළඹ නගර සංවර්ධන සැලැස්මේ 4.5 වන වගන්තිය (මූලික කොළඹ නගර සංවර්ධන සැලැස්ම 1999 සහ 2008 වශයෙන් හඳුන්වනු ලබන) පහත සඳහන් විධිවිධාන 4.5 (උ) ලෙස ඇතුළත් කිරීම මගින් තව දුරටත් සංශෝධනය කෙරේ.

i. ඉහත 1 (i) සහ 1 (ii) මගින් සංශෝධනය වූ කලාපයන් හි සංවර්ධනයන් සඳහා පමණක් මහල් ගණන තීරණය කිරීම පහත පරිදි වේ :

(අ) ව.මී. 1000ට අඩු ඉඩම් සඳහා කොළඹ නගර සංවර්ධන සැලැස්ම (සංශෝධිත) - 2008 හි විශේෂ ප්‍රාථමික නේවාසික කලාපයෙහි පරිදි විය යුතුය.

(ආ) ව.මී. 1000 හෝ ඊට වැඩි ඉඩම් සඳහා කොළඹ නගර සංවර්ධන සැලැස්ම (සංශෝධිත) - 2008 හි C1 පෝරමය සහ සංශෝධිත C2 පෝරමය පරිදි විය යුතුය.

ii. ඉහත 1 (i) සහ 1 (ii) මගින් සංශෝධනය වූ කලාපයන් හි පමණක් අනුබෙදුම් වන ඉඩමක අවම බිම් ප්‍රමාණය කොළඹ නගර සංවර්ධන සැලැස්ම (සංශෝධිත) - 2008 හි විශේෂ ප්‍රාථමික නේවාසික කලාපයෙහි පරිදි විය යුතුය.

**මහින්ද රාජපක්ෂ (පා.ම.),**
නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍ය.

2020 නොවැම්බර් මස 12 වැනි දින,

12 - 20

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.